**කුරුණෑගල මහා නගර සභාව - 2023**

**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 ව්‍යාචනය කළ මතය**

කුරුණෑගල මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කුරුණෑගල මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාචනය කිරීමේ කොටසේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය ව්‍යාචනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යාචනය කළ මතයක් පළ කරනු ලැබේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය ( මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම )

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ, ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නිතී,රීති,වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කොමසාරිස්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගාල්ලවත්ත ප්‍රජා ශාලාව පිහිටි ඉඩම 2020 වර්ෂයේ රු.8,000,000 කට මිලදීගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේ සාවද්‍ය ජර්නල් සටහනක් යොදා එම ඉඩමේ අගය රු.1,923,698 කින් අඩු කර මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වෙනත් ආදායම් ගිණුම රු.500,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සුන්දරාපොළ කසල අංගනයේ පැවති රු.3,752,967 ක් වටිනා පොහොර බෑග් තොගය ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සුන්දරාපොළ කසල අංගනයේ පැවති වටිනාකම රු.41,625 ක් වූ ඇසුරුම් කරන ලද කිලෝ ග්‍රෑම් 25 පොහොර බෑග්111ක් තොග යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | - එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ තුළ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා දරා තිබූ ව්‍යාපෘති 04 ක වටිනාකම වූ රු.242,760,136 ක මුදල වැඩියෙන්ද ව්‍යාපෘති 05 ක වටිනාකම වූ රු.553,489,428 ක් අඩුවෙන් ප්‍රාග්ධනිත කර තිබුණි. | -එම- | - එම- |
| (ඊ) | 2022 වර්ෂයේ ගොඩනැගිලි ඉදි කිරීම සඳහා දරා තිබූ රු.10,915,837 ක මුදලක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී ඉදිරි වර්ෂය සඳහා ලැබුණු වරිපනම් බදු රු.755,069 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වරිපනම් කලින් ලැබීම් ගිණුම තුළ අඩුවෙන් සඳහන් වී ඇති අතර, එය නිවැරදි කිරිමට කටයුතු කර ඇති බව. | -එම -. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ සභිකයින්ගේ දූරකථන දීමනාව හා ඉන්ධන දීමනාව පිළිවෙලින් රු.532,562 ක් හා රු.1,176,270 ක් සභාවේ අරමුදලින් ගෙවා තිබුණද, එම මුදල ප්‍රතිපූර්ණය නොවීම හේතුවෙන් එම වටිනාකම් ණයගැතියන් වැඩියෙන් හා මුදල් ශේෂය අඩුවෙන් දැක්විණි. | ප්‍රතිපූර්ණය නොවන මෙම දිමනා කපා හැරීමට කටයුතු කරන බව. | ප්‍රතිපූර්ණ නොවන දීමනා ඉල්ලුම් කිරීමට කටයුතු නොකළ යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂයේ භාවිතා කරන ලද තාර බැරල් 23 ක වටිනාකම වූ රු.799,020 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කුරුණෑගල මහා නගර සභා භූමියේ ඇති විදුලි හා දුරකථන සම්ප්‍රේෂණ කුළුණ ඉදිකළ ආයතනයෙන් ලැබිය යුතු රු.49,500 මුදලක් ගිණුම්ගත කර නොතිබුණි. | ජර්නල් සටහනක් මගින් ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ ආරම්භ කර නොමැති වැහැර ක්‍රීඩාංගණය වැසිකිළි 02 ක් හා තැපැල් දෙපාර්තමේන්තුව නිල නිවස 03 ක් ඉදිකිරීම් අයවැයගත වටිනාකම රු.40,000,000 ක් ප්‍රාග්ධනිත කර තිබුණි. | ව්‍යාපෘතිය ඉටු කර නොතිබුණ ද මෙතෙක් කළ ක්‍රමවේදය අනුව ණය හිමි වෙන් කිරීම සිදු කරන අවස්ථාවේදී ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායකවීමේ ගිණුම මෙන්ම වත්කම් ගිණුමට ද ගලපා ඇති බව. | ඉදිකිරීම් සම්පූර්ණ වූ පසු ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඕ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.1,427,577 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ස්ථාවර තැන්පත් පොළී ආදායම නිවැරදිව ගැලපීම් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ක) | සේවකයින් 18 දනෙකුගේ අයවිය යුතු ආපදා ණය ශේෂවල එකතුව රු.169,343 ක් අඩුවෙන් ද සේවකයින් 19 දෙනෙකුගෙන් අයවිය යුතු ආපදා ණය ශේෂවල එකතුව රු.249,795 ක් වැඩියෙන් ද ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ග) | 2023 වර්ෂයට අදාළව 2024 ජනවාරි 31 දිනැතිව කළුගල් (චිප්ස්) හා කොන්ක්‍රීට් කළුගල් මිලදී ගැනීම සඳහා ගෙවා තිබූ රු.480,175ක් වූ වටිනාකම ණය හිමි ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ච) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මධ්‍යම අධිවේගී මාර්ගය II ව්‍යාපෘතියට සේවා සැපයීම වෙනුවෙන් ලැබිය යුතු ආදායම් රු.248,670 ක් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් සුදුසු පරිදි සංශෝධනය කිරීමට කටයුතු කරන බව. | -එම- |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම

| | විගණන නිරීක්ෂණය | කොමසාරිස්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.91,216,058 ක් වූ තැන්පත් ගිණුම් 06 කට අදාළ ශේෂය හා උප ලේඛනයේ දැක්වෙන ශේෂය අතර රු.209,696,984 ක වෙනසක් විය. | උපලේඛන නිරවුල් කරමින් පවතින අතර නැවත පරීක්ෂා කර උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම්වලට හේතු හඳුනා ගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.677,941,590 ක් වූ ගිණුම් විෂයයන් 15 කට අදාළ ශේෂයන් හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.257,639,825 ක වෙනසක් විය. | ගිණුම් විෂයන් 15 ට අදාල උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම්වලට හේතු හඳුනා ගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ජංගම නොවන වත්කම ගිණුමවල ශේෂය හා ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුම් ශේෂය සමාන විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම්වල ශේෂය රු.4,759,033,885 ක් වූ අතර ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුම් ශේෂය රු. 4,778,717,488 ක් වීමෙන් රු. 19,683,603 ක වෙනසක් විය. | 2019 වර්ෂයේ සිට පවතින වෙනසක් ලෙස හඳුනාගෙන ඇති අතර පරීක්ෂාකර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම්වලට හේතු හඳුනා ගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම

| | විගණන නිරීක්ෂණය | කොමසාරිස්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයට අනුව තොග වටිනාකම රු.90,089,076 ක් වුවත් වාර්ෂික ගබඩා තොග සමීක්ෂණයක් සිදුකර එම වාර්තාවේ පිටපත් 2024 මැයි 17 දින වන විටත් විගණනයට වෙත ඉදිරිපත් කර නොතිබීම නිසා මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් අවසන් තොග වටිනාකම සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර සමීක්ෂණ කටයුතු ඉතා කඩිනමින් අවසන් කර, අවසන් කළ වහාම විගණනය වෙත ඉදිරිපත් කරන බව. | වාර්ෂික ගබඩා තොග සමීක්ෂණය, අවසන් ගිණුම් පිළියෙල කිරීමට ප්‍රථම ඉටු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.284,533,423 ක් වූ ගිණුම් විෂයයන් 11 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යක්ෂණය කිරීමට නොහැකි විය. | ගිණුම් විෂයන් 11 ට අදාලව උපලේඛන ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 10 කට 2024 මාර්තු 31 වන දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගණුදෙනුවල වටිනාකම රු.308,659,531 ක් විය. | විගණන විමසුම් සඳහා පිළිතුරු සකස් කර කඩිනමින් අදාළ පැහැදිළි කිරීම් යොමු කිරීමට කටයුතු කරන බව. | ව්‍යවස්ථාපිත රාජකාරියක් ලෙස සලකා විගණන විමසුම්වලට පිළිතුරු දීමට කටයුතු කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | කොමසාරිස්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1947 අංක 16 දරණ මහා නගර සභා ආඥා පනත | | | |
| 252 අධිකාරිය | අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතියක් ලබා නොගෙන මහා සභා තීරණයක් මත මහා නගර සභාව සතු MC PLAZA කඩ කාමර 11 ක් දීර්ඝ කාලීනව බදු දීමට කටයුතු කර තිබුණි. | මිල ගණන් කැඳවා විකිණීම / බදු දීම සිදු කරන අතර විවෘත මිල ගණන් කැඳවා නොමැති අවස්ථාවලදී විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතියක් ලබා ගෙන විධිමත් පරිදි විකිණීම හෝ බදු දීම සිදු කරන බව . | යථෝක්ත අධිකාරිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 881(1) | ආදායම් පරීක්ෂක තනතුරට අදාළ රාජකාරි ඉටුකිරීම සඳහා පත්කරන ලද මුරකරු සහ අවමංගල්‍ය ශාලා සහකරු තනතුර දැරූ සේවකයින් දෙදෙනෙක් ඇප තබා නොතිබුණි. | ඇප තැබීමට අවශ්‍ය කටයුතු සලසා ඇති බව. | -එම- |
| (ii) | මුදල් රෙගුලාසි 1645(ඈ) | වාහන භාර නිලධාරියා විසින් එක් එක් ගමන නිමකළ වහාම දෛනික ධාවන සටහනේ කළයුතු තොරතුරු වාර්තා කිරීම නියම කර ඇතත්, නියැදි පරීක්ෂාව අනුව සභාව සතු වාහන 11 ක ධාවන සටහන් අනුව මයිලෝ මීටරය හා වාහනයේ මයිලෝ මීටරය කියවීම අතර කි.මී.2,987 ක වෙනසක් පැවතුණි. | ධාවන සටහන්වල මයිලෝ මීටර් ගණනය කිරීම නිවැරදිව සිදු කිරීමට රියදුරන් දැනුවත් කර ඇති බව. | අවශ්‍ය අඩුපාඩු සකස් කර එක් එක් ගමන නිම කළ වහාම දෛනික ධාවන සටහන් ලිවීම කළ යුතුය. |
| (ඇ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ | | | |
| | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන චක්‍රලේඛයේ, 13.2 ඡේදය | නගර සභාව සතු ගර්හිත තත්ත්වයේ පැවති වාහන 05ක් සම්බන්ධව උක්ත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වාහන අපහරණය සඳහා කඩිනමින් පියවර ගනිමි. | යථෝක්ත ප්‍රකාරව කටයුතු කළ යුතුය. චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | | | | |
|---|---|---|---|---|
| (i) | 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන චක්‍රලේඛය | නගර සභාව සතු වාහන 60 ක රාජ්‍ය ලාංඡනය සලකුණු කර නොතිබුණි. | රාජ්‍ය ලාංඡනය සළකුණු කිරීම සඳහා කටයුතු කරමින් පවතින බව. | රාජ්‍ය ලාංඡනය සමඟ නම සලකුණු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 2016 දෙසැම්බර් 29 වන දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයෙහි 3(1) | මහා නගර සභාවට අයත් වාහන 64 ක ඉන්ධන දහන පරීක්ෂා කර නොතිබුණි. | ඉන්ධන දහන පරීක්ෂාව මේ වන විට සිදු කරමින් පවතින බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | අංක 541(17) 1989 ජනවාරි 20 දිනැති අංක 541(17) දරන අති විශේෂ ගැසට් පත්‍රය | | | |
| | xxi (1) වන කොටසේ මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | නගර සීමාව තුළ අනවසර මාළු වෙළඳසැල් විශාල ප්‍රමාණයක් පවතින අතර එම වෙළඳසැල් විසින් බලපත්‍ර ලබාගැනීමෙන් තොරව වෙළඳාම් කටයුතු සිදුකර තිබුණි. | කිසිදු අවසරයකින් තොරව වෙළඳාම් සිදු කරන අනවසර වෙළඳසැල් ඉවත් කිරීමේ කටයුතු සිදු කරන බව. | යථෝක්ත අතුරු ව්‍යාවස්ථාව ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.144,435,202 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.12,835,988 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | කොමසාරිස්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනය සමඟ ඉදිරිපත් කර තිබූ අගරු චෙක්පත් උපලේඛනයට අනුව මාස 03 සිට වසර 16 ක් දක්වා පවතින අගරු වූ චෙක්පත් 26 කට අදාළව රු.1,312,519 ක ශේෂය සමාලෝචිත වර්ෂය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 වර්ෂය | | | | 2022 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 494,500 | 511,538 | 443,758 | 334,158 | 369,500 | 344,497 | 355,480 | 255,777 |
| කුලී | 116,375 | 101,548 | 105,585 | 10,441 | 88,824 | 75,916 | 72,414 | 14,584 |
| බලපත්‍ර ගාස්තු | 16,402 | 29,439 | 29,439 | - | 15,380 | 19,489 | 19,489 | - |
| වෙනත් ආදායම් | 655,365 | 491,596 | 501,211 | 121,571 | 539,427 | 423,976 | 523,956 | 42,960 |
| **එකතුව** | 1,282,642 | 1,134,121 | 1,079,993 | 466,170 | 1,013,131 | 863,878 | 971,339 | 313,321 |

### 2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | කොමසාරිස්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායම රුපියල් මිලියන 1,134 ක් වූ අතර පෙර වර්ෂයන්ට අදාළව හිඟ ආදායම් ලැබීම්ද ඇතුළුව රුපියල් මිලියන 1,079 ක් සමාලෝචිත වර්ෂයේ රැස්කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේදී රුපියල් මිලියන 466 ක් තව දුරටත් අයකර ගැනීමට පැවතුණි. | හිඟ මුදල් අය කර ගැනීමට කඩිනමින් කටයුතු කරමින් පවතින බව. | බිල් කළ ආදායම් හා හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නගර සභාව සතු ඉඩම් වලින් බිම් කුලී වශයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,325,203 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරනු ලබන බව. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | MC PLAZA අංක D කඩ කාමරය සඳහා වැඩිම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරුගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රථම ගෙවිය යුතු වූ ඉතිරි මුදල වන රු.6,406,639 ක මුදල අයකරගෙන නොතිබුණු අතර ගිවිසුම්ගත නොවී, හිස් අවබෝධතා ගිවිසුමක් ලිපිගොණුවේ ඇතුළත් කර තිබුණි. | කඩ කාමරය පවරා ගෙන නැවත බදු දීම සඳහා අවශ්‍ය කටයුතු විධිමත්ව සිදු කරන බව. | ගිවිසුම්ගතවීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2023 ජුනි 13 දින සිට 2023 ජුනි 19 දින දක්වා සිදුකරන ලද සමීක්ෂණයට අනුව දිනකට බස් නැවතුම්පලේ ඇති පොදු වැසිකිළි දෙකෙහිම රු.77,000 ක සාමාන්‍ය ආදායමක් ලබන බව නිරීක්ෂණය විය. ඒ අනුව වර්තමානයේ මාසයකට අය කරනු ලබන රු.402,627 ක මුදල ප්‍රමාණවත් නොවන බවට තහවුරු විය. | මෙ සම්බන්ධයෙන් විමසා ඇති නීතිපති උපදෙස් ලැබීමෙන් අනතුරුව ඉදිරි කටයුතු ක්‍රියාත්මක කරනු ලබන බව. | නිවැරදිව ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2022 සැප්තැම්බර් 31 දින වන විට මධ්‍යම වෙළෙඳපොල කඩකාමර 29 කින් අයවීමට පැවති රු. 90,546,72 ක් සහ ගෙවීම් ප්‍රමාදය සඳහා සියයට 10 දඩ මුදල 2023 දෙසැම්බර් වන විටත් අයකර ගැනීමට හෝ මුදල් නොගෙවූ කඩකාමර සභාවට පවරාගෙන නැවත ටෙන්ඩර් කිරිමට හෝ සභා බලධාරින් කටයුතු කර නොතිබුණි. | අනපේක්ෂිත ලෙස කඩ කාමර ඉදිකිරීම් කටයුතු අවසන් කර ගත නොහැකි වූ අ තර Key money අයකර ගැනීම සම්බන්ධව අවසන් තීරණයක් ගන්නාතෙක් කඩකාමර පවරා ගැනීමට නීතිමය තත්වයක් නොමැති බවත් කඩ කාමර තවමත් භාර දීමට හැකි තත්වයේ නොමැති නිසා කඩකාමර නගර සභාවට නැවත පවරා ගත නොහැකි වූ බව | ඉදිකිරීම් කටයුතු අවසන් කර ටෙන්ඩර් ලබා දී ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු කඩ කුලී හිඟය රු.8,148,640 ක් විය. | ගෙවනු නොලැබූ කඩ කාමර මුද්‍රා තබා ඇති බව. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | නගර සභාව සතු රන්තලිය තානායමෙන් සමාලෝචිත වර්ෂය අවසනායට රු.4,632,469 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම හිඟ අය කිරීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු මළාපවහන පද්ධතියේ හිඟ ශේෂය රු.148,033,671 ක් විය. | ඉදිරියේදී අතුරු ව්‍යවස්ථාවක් පැනවීමෙන් හෝ වෙනත් විකල්ප උපාය මාර්ග තුළින් හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (එ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ජල ගාස්තු හිඟ ශේෂය රු.101,661,410 ක් විය. | හිඟ මුදල අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුයි. |

### 2.3.6 අධිභාර

| විගණන නිරීක්ෂණය | කොමසාරිස්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ විධි විධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව මවිසින් සමාලෝචිත වර්ෂය තුළ දී රු.51,361,200 ක වටිනාකම වූ අධිභාර 02 ක් පනවා තිබුණි. ඉකුත් වර්ෂය තුළ පැනවූ අධිභාර සමඟ 2024 මැයි 31 වන දිනට රු.450,000 ක මුදලක් පමණක් අයකර ගෙන තිබුණි. | රු.1,000,000 ක මුදලක් අධිභාර කිරීමට අදාළව මේ වන විට රු.550,000 ක මුදලක් අය කර ගෙන ඇති අතර ඉතිරි මුදල් අය කර ගනිමින් පවතින බව. | අධිභාර වටිනාකම් අය කර ගත යුතුයි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

**(අ) කතර්ව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කොමසාරිස්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුරුණෑගල නගරය සංවර්ධනය කිරීමට අදාලව ජලාපවහන සැලැස්ම (Master Drainage Plan) සංශෝධනය කිරීමට අදාල ක්ෂේත්‍ර පරීක්ෂාව සඳහා 2022 මැයි 17 දින රු.540,000 ක මුදලක් වැට් සහිතව අත්තිකාරමක් වශයෙන් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට ගෙවා තිබුණි. ඒ අනුව 2022 මැයි 06 දින අංක GC/06/62/2022/04/20/MED/C7 දරන මහා සභා සම්මුතියට අනුව කුරුණෑගල නගරය සංවර්ධනය කිරීමට අදාලව ජලාපවහන සැලැස්ම සංශෝධන කිරීමට අදාල කාර්යය කඩිනමින් අවසන් කළ යුතු අවශ්‍යතාවයක් ලෙස සලකා මෙම කාර්යය ඉටුකිරීමට අත්තිකාරම් ලබා දී තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් ඉටුකර නොතිබුණි. | අදාළ සෙසු පාර්ශවකරුවන් හා සාකච්ඡා කර අවසානාත්මක සැළැස්ම සකස් කිරීමට නියමිතව ඇති බව. | කාර්ය නිම කළ විගස අත්තිකාරම් පියවිය යුතුයි. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කොමසාරිස්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ප්‍රතිපාදන මත 2019 වර්ෂයේදී රු. මිලියන 123ක් වටිනා කව්ෂිමා කොම්පෝස්ට් යන්ත්‍රය සුන්දරපොළ කසල අංගනයේ ස්ථාපිත කර තිබුණි. මෙම යන්ත්‍රයේ ධාරිතාව ටොන් 50ක් වුවත් දිනකට කසල ටොන් 30 ක් පමණ යෙදීමෙන් උපරිම ධාරිතාව ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | නගරය තුළ දිරන කසල ලෙස ජනනය වන්නේ ටොන් 30 ක පමණ ප්‍රමාණයක් බැවින් ඉදිරි ප්‍රවණතාද සැලකිල්ලට ගනිමින් මෙම යන්ත්‍රය ස්ථාපනය කරන ලද බව. | යන්ත්‍රයෙන් උපරිම ප්‍රයෝජනය ගැනීම කළ යුතුය. |

**3.2 අනාර්ථික ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කොමසාරිස්ගේ අදහස් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුරුණෑගල විල්ගොඩ පාරේ පිහිටි විල්ගොඩ මුතුගල ඉඩම 2013 වර්ෂයේ දී රු.6,000,000 ට මිලදී ගෙන තිබුණු අතර එය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් වන විටත් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වල් වැදී නිශ්කාර්යව පැවතුණි. | මෙම ඉඩම භාවිතයට ගැනීම සඳහා සුදුසු ආයෝජකයෙකු හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතී. | නිෂ්කාර්යව නොතබා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා නව මෘදුකාංග යටතේ රාජකාරී කිරීමේ අරමුණින් 2022 වර්ෂයේදී වටිනාකම රු.2,046,000 වූ පරිගනක ටැබ් 60 ක් මිලදී ගෙන නිලධාරීන්ට බෙදා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය වන විට උක්ත ටැබ් 05ක් වෙන්දේසි කර තවත් ටැබ් 06 ක් අක්‍රීය තත්ත්වයේ පැවතීම නිසා ගබඩාවට භාර දී තිබුණු අතර ඉතිරි ටැබ් 49 නිලධාරීන් 47 දෙනෙකු භාරයේ පැවතිණි. ඒ අනුව නව මෘදුකාංග යටතේ රාජකාරී සිදු කිරීමට උක්ත ටැබ් මිලදී ගත්තද එය ක්‍රියාත්මක වී නොතිබුණි. | මෙම ටැබ් 2020 වර්ෂයේදී මිළදිගෙන ඇති අතර, මෘදුකාංගය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අනෙකුත් උපාංග එවකට රටෙහි පැවති වාතාවරණය මත ගෙන්වීමට නොහැකි වූ බව. | මෘදුකාංග ලබාගෙන අදාළ කටයුතු සිදු කළ යුතුය. |

### 3.3 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කොමසාරිස්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභිකයින් වෙත ලබා දී තිබුණු ලැප්ටොප් පරිගණක 09 ක තක්සේරු වටිනාකම වූ රු.2,296,997 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභිකයින් වෙත තක්සේරු වටිනාකම සම්බන්ධයෙන් දැනුවත් කර පරිගණක වල වටිනාකම අය කර ගැනීම හෝ පරිගණක නැවත ලබා ගැනීමට හෝ කටයුතු කරන බව. | තක්සේරු වටිනාකම අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කොමසාරිස්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ජයන්තිපුර ප්‍රදේශයේ ජනතාවගේ පොදු කටයුතු උදෙසා වෙන්කර ඇති රූඩ් 01 පර්චස් 35 ක ඉඩම පෞද්ගලික ආයතනයක් විසින් තම ව්‍යාපාර කටයුතු සඳහා සභාවේ අවසරයකින් තොරව දීර්ඝ කාලයක සිට භාවිතා කර තිබුණි. | 2024 මැයි 08 දින පැවති මෙහෙයුම් හා මූල්‍ය කළමනාකරණ කමිටුවේදී තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කරමි. | අනවසර ඉදිකිරීම් හා අනවසර අල්ලා ගැනීම් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දිගු කාලයක සිට පැවත එන හඳුනාගත නොහැකි සේවක ණය ශේෂය රු.45,586,008 ක් නිරවුල් කර නොතිබුණි. | නිරීක්ෂණ සඳහා අදහස් ඉදිරිපත් කර නොමැත. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සේවක ණය උපලේඛනයේ එකතුව රු. 1,177,151 ක් වූ උත්සව අත්තිකාරම් ණය ශේෂ 58 ක්, විශේෂ ණය ශේෂ 40 ක් හා ආපදා ණය ශේෂ 17 ක් සේවක ණය ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | පරික්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ලේඛන නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම යාම, මියයාම, ස්ථාන මාරුවීම සහ වැටුප් නතර කර සිටීම වැනි හේතු නිසා නිලධාරීන් 23 දෙනෙකුගෙන් රු.2,277,451ක ණය ශේෂයක් අයකර ගැනීමට තිබුණි. | පරික්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 මෙහෙයුම් අකායර්ක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කොමසාරිස්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විසල් කුරුණෑගල ජල සම්පාදන ව්‍යාපෘතිය මඟින් කුරුණෑගල මහා නගර සහා බල ප්‍රදේශයේ පාරිභෝගිකයින් හට බෙදා හැරීම සඳහා මහා නගර සභාව මුදල් ගෙවා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් මිලදී ගන්නා ලද තොග ජලයෙන් සියයට 38 කට වැඩි ප්‍රමාණයක් අපතේ යැමක් සිදුව තිබුණි. එසේම ජල බෙදාහැරීම විධිමත් කිරීම සඳහා තොග ජල මනු සවි කිරීමට රු.2,264,700 ක් වැයකර මිලදීගෙන තිබුණු උපකරණ නිශ්කාර්යව ගබඩාවේ පැවතුණි. | ජලය අපතේ යැම හඳුනා ගැනීම සඳහා ජල සම්පාදන මණ්ඩලය හා එක්ව තොග ජල මනු සවි කිරීමට අදාළ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව. | ජලය අපතේයාම අවමකර එහි වාසිය පාරිභෝගිකයින්ට ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (අ) | කුරුණෑගල MC PLAZZA සාප්පු සංකීර්ණය පිරිසිදු කිරීමට අදාළ සේවා කොන්ත්‍රාත්තුවේ ගිවිසුම් කාලය 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වුවද කාලය දීර්ඝ කිරීමකින් හෝ නව සේවා ගිවිසුමකට එළඹීමකින් හෝ තොරව එකම කොන්ත්‍රාත්කරුගෙන් 2023 ජූනි 30 දක්වා වැඩිපුර මාස 6 කට සේවා ලබා ගැනීම වෙනුවෙන් රු.1,376,670ක් ගෙවීම් කර තිබුණි. | 2023 වර්ෂයේ අයවැය සම්මත නොවීම හේතුවෙන් නව ආයතනයක් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීමට නොහැකි වූ බැවින් සේවා සපයන ලද ආයතනය වෙතින්ම එම මිල යටතේම අදාළ සේවාව සපයා ගන්නා ලද බව. | සේවාව අවසන් වීමට ප්‍රථම නව ගිවිසුමකට ඇතුලත් වීමට කටයුතු කළ යුතුය. |

## 3.6 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කොමසාරිස්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගිවිසුම් කාලය අවසන් වී විගණිත දිනය වූ 2024 මැයි 17 දින වන විටත් ගිවිසුමකින් තොරව කුරුණෑගල බස් නැවතුම්පල වැසිකිළි පිරිසිදු කිරීමේ කාර්යය පෙර බදුකරුටම ලබා දී තිබුණි. ඒ අනුව ටෙන්ඩර් ක්‍රමවේදයකින් තොරව මහා සභා තීරණය වසර 05 කින් දීර්ඝ කිරීමේ කාලය ආණ්ඩුකාර ලේකම් විසින් වසර 10ක් දක්වා දීර්ඝ කිරීම මතභේදයට තුඩුදෙන කරුණක් විය. | පැන නැගී ඇති කරුණු සම්බන්ධයෙන් නීතිපති වෙතින් විමසා ඇති අතර පිළිතුරු ලද පසු එම උපදෙස් අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | නීතිමය උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

## 3.7 නිෂ්කාර්යය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කොමසාරිස්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | විල්ගොඩ මෝල වත්ත ඉඩම නගර සභාව සතු ඉතා විශාල ආර්ථික වටිනාකමක් සහිත පර්චස් 14 ක ඉඩමක් වන අතර එහි ඉදිකිරීම් අවසන් නොවූ ගොඩනැගිල්ලක් පැවති අතර එය ප්‍රජා ශාලාවක් ලෙස භාවිතය සඳහා ඉදිකිරීම් කර තිබුණද එය දීර්ඝ කාලයක් භාවිතා කර නොතිබුණි. | ගොඩනැගිල්ලේ ඉතිරි කටයුතු නිම කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර එම ප්‍රදේශයේ පොදු අවශ්‍යතා වෙනුවෙන් මෙම ගොඩනැගිල්ල යෙදවීමට කටයුතු කරන බව. | සභා දේපල උපයෝජනය කිරීම කළ යුතුය. |
| (ආ) | ඉංජිනේරු අංශය විසින් 2021 වර්ෂයේ ජූලි මාසයේ ඇනවුම් කල PE ජලනල උපකරණ 2021 ජූලි මාසයේ මිලදී ගෙන ඇතත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් රු.1,187,000 ක් වටිනා ජල උපකරණ වර්ග 05 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගබඩාවේ පැවතුණි. | මේ වන විට එම ජල නල උපාංග වරින් වර සිදුවන ජල නඩත්තු කටයුතුවලදී ප්‍රයෝජනයට ගනු ලබන බවත්. ඉතිරි ජල නල උපාංග ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සමග හුවමාරු කර ගැනීමට අවශ්‍ය කටයුතු මේවන විට සිදු කරමින් පවතින බවත්. | ප්‍රශස්ථ තොගයක් ගබඩාවේ පවත්වා ගත යුතුය. |

## 3.8 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කොමසාරිස්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | නිශ්ශංක මාවතේ පස්වෙනි පටුමගේ නගර සභාව සතු වැහැර වත්ත ඉඩමේ පිහිටා තිබූ පොදු ළිඳ සහිත පර්චස් 20 කට ආසන්න ඉඩම බදු දීමකින් තොරව පුද්ගලයෙකු විසින් අනවසරයෙන් භුක්ති විඳිමින් තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වටිනාකම් ලද පසු කමිටු නිර්දේශ අනුව මෙම ඉඩම් වල අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් ඉදිරි තීරණ ගැනීමට අපේක්ෂිත බව. | අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |
| (ආ) | නගර සභාව සතු නිශ්ශංක මාවතෙහි 05 වන පටුමගෙහි පිහිටා ඇති වැහැර වත්ත ඉඩමේ පර්චස් 7.78 බැගින් වූ කොටස් 03 කින් යුත් ඉඩම දීර්ඝ කාලයක් තිස්සේ බදු දීමකින් තොරව තුන් දෙනෙකු විසින් භුක්ති විඳිමින් සිටින අතර පළමු කොටසේ මේ වන විට නගර සභාවේ අනුමැතිය නොගෙන ඉදිකිරීම් සිදු කරමින් තිබූ ගොඩනැගිල්ලක් හා මාර්ගයට මුහුණලා ඇති පැත්තේ වැට ගසා තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වටිනාකම් ලද පසු කමිටු නිර්දේශ අනුව මෙම ඉඩම්වල අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් ඉදිරි තීරණ ගැනීමට අපේක්ෂිත බව. | අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |
| (ඇ) | නගර සභාව සතු වැහැර වත්ත ඉඩමේ නිශ්ශංක මාවත තුන්වන පටුමගේ පිහිටා තිබූ නගර සභාව සතු ඉඩම කොටස් 03 කට බෙදා තිබූ අතර එහි නගර සභා අනුමැතිය නොමැතිව වැඩ අවසන් නොවූ ගොඩනැගිලි 02 ක් ඉදිකිරීම් සිදු කරමින් පැවතුණි. තවද මෙම ඉඩමද බදු දීමකින් තොරව දීර්ඝ කාලයක් තිස්සේ පෞද්ගලික පරිහරණයට යොදාගෙන තිබූ අතර මේ සඳහා ජල සැපයුමද ලබාගෙන තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වටිනාකම් ලද පසු කමිටු නිර්දේශ අනුව මෙම ඉඩම් වල අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් ඉදිරි තීරණ ගැනීමට අපේක්ෂිත බව. | අනවසර ඉදිකිරීම් හා අනවසර අල්ලා ගැනීම් පාලනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | වෙනත් ආයතනවල නමට ලියාපදිංචි වී ඇති සභාව පරිහරණය කරනු ලබන වාහන 04ක අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව. | සභාව වෙත පවරා ගත යුතුයි. |

| | විගණන නිරීක්ෂණය | කොමසාරිස්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ඉ) | කුරුණෑගල ශික්ෂණ රෝහල ඉදිරිපිට පොදු වැසිකිළිය සඳහා වෙන්කර තිබූ පර්චස් 4.74 ක ඉඩම රජයේ ඉඩමක් වුවත් එය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | මහා නගර සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | සභාව වෙත පවරා ගත යුතුය. |
| (ඊ) | පොදු හා විදුලි ගබඩාවට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව 2022 දෙසැම්බර් 31 දිනට රු.1,447,137 ක් වටිනා තොග අයිතම 59 ක ඌනතාවයක් හා රු.173,984 ක් වටිනාකමැති තොග අයිතම 27 ක අතිරික්තයක් පැවති අතර විගණිත දිනයන් වූ 2023 මැයි 31 හා ජුනි 01 දින විටද එහි තව දුරටත් වටිනාකම රු.864,102 ක් වූ අයිතම 46 ක ඌනතාවයක් හා රු. 266,786 ක් වටිනා තොග අයිතම 30 ක අතිරික්තයක් පැවතුණි. | 2023 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර අවසන් බවත් 2022 භාණ්ඩ සමීක්ෂණයේදී භාණ්ඩ හඳුනා ගැනීමෙන් වූ වරද නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව. | ඌනතාවලට හේතු හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |

### 3.9. කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කොමසාරිස්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ මහා නගර සභා ප්‍රතිපාදන මත සුන්දරාපොළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ අලුත්වැඩියා කටයුතු සඳහා රු.3,000,000 ක ඇස්තමේන්තුවක් සකස් කර කොන්ත්‍රාත් ආයතනයක් සමඟ රු.2,610,983 ක මුදලකට ගිවිසුම්ගත වී තිබූ අතර කර්මාන්තයේ වැඩ නිම නොකර අත්හැර දමා තිබුණි. | පිළිගන්නා බව. | ගිවිසුම පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 වර්ෂයේ පළාත් සභා හා පළාත් සභා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත සුන්දරාපොළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු. 34,054,468 කට ගිවිසුම්ගතව තිබූ අතර ඒ වෙනුවෙන් කරන ලද වැඩ සඳහා 2022 වර්ෂයේදී රු.10,708,634 ක් ණය හිමි ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉතිරි වැඩ සඳහා ඇස්තමේන්තු සකස් කර පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බවත් ප්‍රතිපාදන ලැබුණු පසු නැවත ආරම්භ කරනු ලබන බවත්. | ප්‍රසම්පාදනය කර කොන්ත්‍රාත්කරුවකු සොයා ගැනීම කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඈ) අත්හිටුවූ කර්මාන්තයක් වෙනුවෙන් 2022 මැයි 21 වන දින ගෙවන ලද රු.1,445,847 ක අත්තිකාරමක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | ආණ්ඩුකාරතුමාගේ අංක NWP/GOV/AD/02/06/ 13 හා 2022.07.02 දිනැති ලිපිය අනුව මේ වන විට මෙම ඉදි කිරීම් අත්හිටුවා ඇත. අත්තිකාරම් මුදලින් එම බිල්පතෙහි වටිනාකම අඩු කර ඉතිරි මුදල අය කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඉදිරියේදී කටයුතු කරන | සභාවට සිදු වූ අලාභය සඳහා ඉදිරියේදී අධිභාර පැනවීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) 2021 වර්ෂයේ පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ රු.9,813,676 ක ප්‍රතිපාදන අනුමත කර ඒ සඳහා ඇස්තමේන්තුවක් සකස් කර කොන්ත්‍රාත් ආයතනය සමඟ රු.9,191,808 ක මුදලකට බස් නැවතුම්පල ඉහළ මහලේ වැසිකිළි පද්ධතිය ඉදිකිරීම සඳහා 2021 සැප්තැම්බර් 09 දින ගිවිසුම්ගත වී තිබුණු අතර මෙම ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් 09 දින අවසන් කළ යුතුව තිබුණි. ඒ අනුව රු.1,838,311 ක් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස ලබා දී රු.1,753,404 ක වැඩ නිමකර තිබුණු අතර කොන්ත්‍රාත්කරු විසින් වැඩ අතරමග නවතා 2023 දෙසැම්බර් 31 දින වන විටත් නිමකිරීමට කටයුතු කර නොතිබුණි. | සිදු වී ඇති අලාභය අයකර ගැනීමට නිතීමය කටයුතු කර ඇති බව. | කොන්ත්‍රාත්කරුගේ අදායම් ලේඛන ගතකර පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.10 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කොමසාරිස්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නගර සභාවේ අනුමත කාර්යය මණ්ඩලය තුළ ආදායම් පරීක්ෂකවරු 07 ක් සිටිය යුතු වුවත් 2023 දෙසැම්බර් 31 දින වන විට එක් නිලධාරියෙකු පමණක් සේවයේ නිරතව සිටි අතර දීර්ඝ කාලයක් තිස්සේ එම තනතුරට අදාළ නිලධාරීන් බඳවා නොගෙන කාර්යයාල සහයක, රියදුරු, කම්කරුවන්, මුරකරුවන් හා දෛනික පදනම මත බඳවාගෙන ඇති 11 දෙනෙක් මඟින් වැඩ ආවරණ කරමින් තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස ඉල්ලීම් කර ඇතත් එය මෙතෙක් සම්පූර්ණ කර නොමැති නිසා දීර්ඝ කලක සිට පවතින මෙම පුරප්පාඩු අනෙකුත් ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින්ගෙන් හා දෛනික සේවකයින්ගෙන් සපුරා ගැනිමට සිදුව ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 පෙබරවාරි 09 වන දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී විගණකාධිපති සටහනේ ඡේද අංක 1.8 අනුව කාර්යය මණ්ඩල තොරතුරු සම්බන්ධයෙන් ලබා දුන් නියෝග අනුව "මුදල් අමාත්‍යාංශය සම්බන්ධ කර ගනිමින් අවශ්‍ය සේවක බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලබා ගන්නා ලෙස කාරක සභාව ප්‍ර.ග.නි වෙත නියෝග කළේය. නමුත් වර්තමාන තත්ත්වය පරීක්ෂා කිරීමේදී කාරක සභාව දුන් නියෝග පිළිපැදීමකින් තොරව 2021 පෙබරවාරි 09 වන දිනට පසුවත් දෛනික දීමනා මත සේවකයින් 71 දෙනෙකු බඳවාගෙන තිබුණි. | ජනතාව අපහසුතාවයට පත් නොකර කාර්යක්ෂම සේවාවක් ලබා දීම අරමුණු කර ගනිමින් මහා සභා අරමුදලින් වැය දරමින් අදාල කාර්යයන් ඉටු කර ගැනීමට ප්‍රමාණවත් සේවක පිරිසක් වියීමත් පරිදි සේවයේ යොදවා ඇති බව. | රජයේ ගිණුම් කාරක සභා නියෝග ඒ ආකාරයෙන් පිළිපැදිය යුතුය. |

## 3.11 වාහන පද්ධති කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කොමසාරිස්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහා නගර සභාව සතු වාහන 07 ක මයිලෝ මීටර් අක්‍රීයව පැවති අතර ඒවා අළුත්වැඩියා කිරීමෙන් තොරව ධාවනය කර තිබුණි. | අළුත්වැඩියාවට අවශ්‍ය අමතර කොටස් සපයාගෙන එම වාහන අළුත්වැඩියා කිරීමට කටයුතු කරන බව. | කඩිනමින් අළුතිවැඩියා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මහා නගර සභාවේ සේවය කරන රියදුරු තනතුරේ නොවන සේවකයින් 23 දෙනෙකු සඳහා වාහනවල රියදුරු රාජකාරි පවරා තිබුණි. | ප්‍රමාණවත් රියදුරන් නොමැති වීම හා සේවා අවශ්‍යතාවය සලකා සුදුසුකම් සනාත කර ගැනීමෙන් අනතුරුව ඔවුන්ගේ සේවය ලබාගැනීමට කටයුතු කර ඇති බව. | රියදුරු තනතුරු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | නගර සභාවේ වාහන නියදි පරීක්ෂාවේදී වාහන 09 ක ආදායම් බලපත්‍රවල කාලය ඉකුත් වී තිබුණු අතර ඉන් වාහන 05 ක් 2021 හා 2022 වර්ෂයේ සිටම ආදායම් බලපත්‍ර ලබා නොගෙන ධාවනය කරන බවට නිරීක්ෂණය විය. | අළුත්වැඩියා සඳහා යොමු කිරීම, මුල් ලේඛන අස්ථාන ගතවීම, ධාවන තත්ත්වයේ නොතිබීම හා රක්ෂණ හිමිකම් ලබා ගැනීමට ප්‍රමාද වීම නිසා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට නොහැකි වූ බව. | කල් ඉකුත් වූ වහාම ආදායම් බලපත්‍ර ලබා ගැනීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නගර සභාවට පරිත්‍යාග කරන ලද ලොරි රථයක්, බොබ්කැට් යන්ත්‍රයක් (Bobcat) JCB Mini Baco loader ක් දීර්ඝ කාලයක සිට ලියාපදිංචි කිරීමට කටයුතු නොකිරීම නිසා ආදායම් බලපත්‍ර හා රක්ෂණ සහතික ලබා ගැනීමට නොහැකි වීම හේතුකොටගෙන එම ලොරි රථයෙන් හා යන්ත්‍ර වලින් කිසිදු සේවාවක් ලබා ගැනීමට නොහැකිව නිෂ්කාර්යය තත්ත්වයේ පැවතුණි. | ලියාපදිංචියට අවශ්‍ය කිසිදු ලිපි ලේඛනයක් ඊට අදාළ ගොනු තුළ නොමැති වීම මත එය ලියාපදිංචි කර ගැනීමට නොහැකි වී ඇති බව. | සභාවට අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2017 හා 2018 වර්ෂවල අළුත්වැඩියාව සඳහා යොමු කළ වාහන දෙකක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අලුත්වැඩියාව සිදු නොකර බාහිර ගරාජවල ගාල් කර තිබූ බව නිරීක්ෂණය විය. | අළුත්වැඩියා කටයුතු නිම කිරීම සඳහා අමතර කොටස් සපයා ගත නොහැකිව පවතින බවත් 64-7609 රථය මේ වන විට අපහරණයට යොමු කර ඇති බවත්. | අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කොමසාරිස්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව (කර්මාන්ත අංශයේ ආංශික සැලැස්ම) සභාව විසින් ව්‍යාපෘති 13 ක් ඉටුකළ යුතුව තිබුණත් ඉන් ව්‍යාපෘති 04 ක් පමණක් ඉටුකර තිබුණි. එසේ ඉටු නොකළ ව්‍යාපෘති හා ඒ සඳහා වාර්ෂික අයවැය මඟින් රු.127,900,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. | අක් මුදල් හිඟකම මත මෙම ව්‍යාපෘති ඉටු කිරීමට නොහැකි වූ බවත් ඉදිරියේදී ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කරනු ලබන ව්‍යාපෘති ඉටුකිරීමට කටයතු කරනු ලබන බවත්. | ක්‍රියාකාරී සැලැස්මට අනුගතව සභාවේ කටයුතු මෙහෙයවීමට ක්‍රියා කළ යුතුය. |